ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව
இலங்கை பெற்றோலியக் கூட்டுத்தாபனம்
CEYLON PETROLEUM CORPORATION
CEYPETCO
ENERGIZING THE FUTURE

## මාධ්‍ය නිවේදනයයි

2022 අගෝස්තු මස 01 වන දින.

ප්‍රධාන කතෘ/ ප්‍රවෘත්ති කතෘ,
ප්‍රවෘත්ති අධ්‍යක්ෂ/ කළමනාකාර (ප්‍රවෘත්ති) /ප්‍රවෘත්ති සංස්කාරක,

මහත්මයාණනි/මහත්මියනි,

**ලංකා සුදු ඩීසල් සිල්ලර මිල සංශෝධනය කිරීම - 2022.08.01.**

2022 අගෝස්තු මස 01 වන දින රාත්‍රී 10.00 සිට බලපැවැත්වෙන පරිදි ලංකා සුදු ඩීසල් සිල්ලර මිල සංශෝධනය කිරීමට (පහත දැමීමට) තීරණය කර ඇතිබව මෙයින් දැනුම්දෙමු.

ඒ අනුව, දිවයිනටම බලපාන නව ලංකා සුදු ඩීසල් සිල්ලර මිල පහතින් දක්වමු.

| නිෂ්පාදන සංකේත අංකය | ඉන්ධන වර්ගය | ලීටරයක වර්ථමාන මිල | සංශෝධනය වූ මුදල | ලීටරයක නව මිල |
|---|---|---|---|---|
| A0013L99 | ලංකා සුදු ඩීසල් | රු 440.00 | (රු 10.00) | රු 430.00 |

පහත ඉන්ධන වර්ගයන්හි මිල ගණන් නොවෙනස්ව පවතින බව සලකන්න.

| නිෂ්පාදන සංකේත අංකය | ඉන්ධන වර්ගය | ලීටරයක වර්ථමාන මිල |
|---|---|---|
| A0023L99 | ලංකා පෙට්‍රල් 92 ඔක්ටේන් | රු 450.00 |
| A0018L99 | ලංකා පෙට්‍රල් 95 ඔක්ටේන් යූරෝ 4 | රු 540.00 |
| A0016L99 | ලංකා සුපිරි ඩීසල් 4 ස්ටාර් යූරෝ 4 | රු 510.00 |
| A0017L99 | ලංකා භූමිතෙල් | රු 87.00 |

මෙම මිල සංශෝධනය පිළිබඳව ඉන්ධනහල් හිමියන් සහ සිපෙට්කෝ පාරිභෝගික භවතුන් ඔබ මාධ්‍ය ආයතනය ඔස්සේ දැනුවත්කිරීමට කටයුතු කරනමෙන් ඉල්ලා සිටිමු.

තවද, සියළුම ඉන්ධන පිරවුම්හල් විසින් දැනටමත් විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය විසින් හඳුන්වා දී ඇති ජාතික ඉන්ධන අවසරපත (National Fuel Pass) අනුව, එනම් QR කේතය හරහා පමණක් ඉන්ධන නිකුත්කිරීම අනිවාර්ය බව වැඩිදුරටත් මෙයින් දැනුම්දෙමු.

මේ පිළිබඳව වැඩිදුර විස්තර දුරකථන අංක 0115 234234, 0115 455126/130 ඔස්සේ සංස්ථා මාධ්‍ය අංශය ඇමතීමෙන් ලබාගත හැකිබව සලකන්න.

ස්තූතියි.

**ආයතනික සන්නිවේදන හා පාරිභෝගික සේවා ඒකකය,**
අලෙවි කාර්යාංශය,
අංක 609, දොස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත,
කොළඹ 09.
දුරකථන : 0115 455126/0115 455130 ෆැක්ස් : 0115 455431
සීපීඑස්/එන්එස්කේ